# බළන්ගොඩ නගර සභාව

## 2022-03-08 වන දිනැති මහා සභා රැස්වීම් වාර්තාව

**ස්ථානය - බළන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව**

**දිනය - 2022.03.08**

**වේලාව - පෙ.ව. 10.00**

**බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපති ඩබ්.ඒ. වසන්ත ගුණරත්න මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් මෙදින මහ සභාවේ කටයුතු පවත්වන ලදී.**

**සහභාගීත්වය**

| | |
|---|---|
| 1. ගරු සභාපති | ඩබ්.ඒ. වසන්ත ගුණරත්න මැතිතුමා |
| 2. ගරු උප සභාපති | එම්.ටී.එම්.රුමි මැතිතුමා |
| 3. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා |
| 4. ගරු නාගරික මන්ත්‍රී | ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා |
| 5. ගරු නාගරික මන්ත්‍රි | එම්. ජුනයිදීන් මලික්ෂා මැතිතුමා |
| 6. ගරු නාගරික මන්ත්‍රි | එම්. නිමල් කරුණාරත්න මැතිතුමා |
| 7. ගරු නාගරික මන්ත්‍රී | නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා |
| 8. ගරු නාගරික මන්ත්‍රිනි | ජී. චන්ද්‍රලතා මැතිතුමිය |
| 9. ගරු නාගරික මන්ත්‍රි | එම්.එස්.පී.ගලප්පත්ති මැතිතුමා |
| 10. ගරු නාගරික මන්ත්‍රි | එම්. ඩබ්. විමලසිරි මැතිතුමා |
| 11. ගරු නාගරික මන්ත්‍රී | රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා |
| 12. ගරු නාගරික මන්ත්‍රිනී | පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය |
| 13. ගරු නාගරික මන්ත්‍රීනී | සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය |
| 14. ගරු නාගරික මන්ත්‍රිනි | එම්. ශාන්තිලේඛා මැතිතුමිය |
| 15. ගරු නාගරික මන්ත්‍රි | කේ. ජී. පේමදාස මැතිතුමා |
| 16. ගරු නාගරික මන්ත්‍රීනී | මංගලිකා ඉලංකෝන් මැතිතුමිය |

**නිළධාරි සහභාගීත්වය**

| | |
|---|---|
| 1. ලේකම් | ඩී.එම්.ජේ.යූ.ධර්මරත්න මයා |

**01. පසුගිය සභාවේ 2022-02-07 දිනැති මහා සභා වාර්තාව හා 2022-02-03, 2022-02-22, 2022-02-28 දිනැති විශේෂ මහ සභා වාර්තා සභා සම්මත කිරීම.**

මෙදින මහ සභාවේ වැඩ කටයුතු ආරම්භ කළ ගරු සභාපතිතුමා, ආගම සිහි කිරීමෙන් අනතුරුව සභාව සඳහා සහභාගි වූ ගරු මන්ත්‍රී මණ්ඩලය, ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලය හා මාධ්‍යවේදීන් ඇතුළු සියළුදෙනා පිළිගන්නා ලදී.

ඉන් අනතුරුව 2022-02-07 දින පැවති මහ සභාවේ සභා වාර්තාව හා 2022-02-03, 2022-02-22, 2022-02-28 දින පැවති විශේෂ මහ සභා වාර්තාවන් සංශෝධනයන්ට යටත්ව සත්‍යය වාර්තාවක් බවට සභා සම්මත කර ගන්නා ලෙස පවසා සිටින ලදී.

මෙහි දී ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා, 2022-02-07 දින පැවති මහ සභා වාර්තාව හා 2022-02-03, 2022-02-22, 2022-02-28 දින පැවති විශේෂ මහ සභා වාර්තාවන් සංශෝධනයන්ට යටත්ව සත්‍යය වාර්තාවක් බවට යෝජනා කළ අතර ගරු නාගරික මන්ත්‍රීනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

ඒ අනුව ගරු සභාපතිතුමා විසින් මෙදින සභා වාර්තාවේ සංශෝධනයන් තිබේදැයි විමසූ අතර, 2022-02-07 දින පැවති මහ සභාවේ කල් දී ඇති යෝජනා අංක 06:01:26 බළන්ගොඩ නගර සභාව මඟින් 2018/2019, 2019/2020, 2020/2021 අධ්‍යයන වර්ෂ සඳහා විශ්ව විද්‍යාල ශිෂ්‍යත්ව ලබා ගැනීමට අයදුම්පත්‍ර භාර දුන් ශිෂ්‍යත්වලාභීන්ගේ සංශෝධිත නාම ලේඛනය සඳහා සභා අනුමැතිය ලබා ගැනීම යටතේ විශ්ව විද්‍යාල ශිෂ්‍යත්ව ලබා දීම හා පොත් ලබා දීම සඳහා 6-5-472 (i) ශීර්ෂය යටතේ රු. 300,000.00 ක මුදලක් වෙන් කර ඇති අතර, එක් අයෙකුට රු. 10,000.00 බැගින් අයදුම්කරුවන් 20 දෙනෙකුට ලබා දීමටත් එහි දී අඩු ආදායම්ලාභී පවුල්වල සාමාජිකයන්ට පමණක් ශිෂ්‍යත්ව ලබා දීමේ දී අනෙකුත් දරුවන්ට අසාධාරණයක් වන බැවින් දරුවන්ගේ දක්ෂතාවය ඇගයීම වෙනුවෙන් පොදුවේ විශ්ව විද්‍යාල ශිෂ්‍යත්ව ලබා ගැනීම සඳහා ඉල්ලුම් කර ඇති බළන්ගොඩ නගර සභා බල ප්‍රදේශයේ දරුවන් සඳහා ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම සුදුසු බවටත් යන තීරණය මුද්‍රණ දෝෂයක් හේතුවෙන් ඇතුලත් වී නොමැති අතර, එය සංශෝධනය විය යුතු බව පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා සංශෝධන ඉදිරිපත් කරමින් 2022-02-07 දිනැති මහ සභාවේ කල් දී ඇති ප්‍රශ්න යටතේ (පිටු අංක 05) තමන් විසින් ඉදිරිපත් කළ අදහස් දැක්වීමේ දී නගර සභාවක් විසින් ලබා දෙන කඩ කාමරයක ගිවිසුම් කඩ කළ විට ගන්නා ක්‍රියාමාර්ගය විමසූ අතර, එය සටහන්ව නොමැති බව ද මේ සම්බන්ධව පිළිතුරක් ලබා ගැනීමට පළාත් පාලන කොමසාරිස්තුමා වෙත ලිපියක් යොමු කළ බව පැවසීය.

එමෙන්ම 2022-02-07 දිනැති මහ සභාවේ මන්ත්‍රී යෝජනා යටතේ තමන් ඉදිරිපත් කළ බළන්ගොඩ තානායම සම්බන්ධ යෝජනාවේ දී (පිටු අංක 45) හි "ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණි විමලසේන මැතිතුමා පොහොය දින අරක්කු ව්‍යාපාරය කිරීම නිසා මහජන මුදලින් ලක්ෂ 16 හමාරක් ගෙවා ඇත්තේ මෙම කළමනාකාරිත්වය තුළින්" යන්න පිළිබඳව කළ ප්‍රකාශයට තමන් පිළිතුරු ලබා දෙමින් එය සිදු වූයේ එරික් සිසිල් යන අයගේ කළමනාකාරිත්වය පැවති කාලයේ නොව වෙනත් අයෙකුගේ පාලන කාලය තුළ දී

බව ද නගර සභා පාලන කාලයේ යැයි පැවසීමට නොහැකි නිසා වෙනත් අයෙකුගේ යැයි පැවසූ බව ද එය සටහන්ව නොමැති බැවින් සංශෝධනය විය යුතු බව ද පැවසීය.

ගරු නාගරික මන්ත්‍රිනී තරංගනී සමරසේකර මැතිතුමිය සංශෝධන ඉදිරිපත් කරමින් 2022-02-22 දිනැති විශේෂ මහ සභාවේ "පොදු වෙළඳපොළ මාළු කඩ සම්බන්ධ යෝජනාවේ (පිටු අංක 03) තමන් විසින් කරන ලද අදහස් දැක්වීමේ දී ටෙන්ඩර් කරන්නේ නම් මාළු ගබඩා කාමර ඇතුළුව සියලුම මාළු කඩ ටෙන්ඩර් කළ යුතුයි" යන්න සටහන්ව නොමැති අතර, එය සංශෝධනය විය යුතු බව පවසන ලදී.

**ඒ අනුව ඉහත සංශෝධනයන්ට යටත්ව 2022-02-07 දින පැවති මහ සභාවේ සභා වාර්තාව හා 2022-02-03, 2022-02-22, 2022-02-28 දින පැවති විශේෂ මහ සභා වාර්තා ගරු සභාවේ සම්මත විය.**

**ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්. විමලසිරි මැතිතුමා පෙ.ව 10.10 ට පමණ සභාවට පැමිණෙන ලදී.**
**ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා පෙ.ව 10.12 ට පමණ සභාවට පැමිණෙන ලදී.**

## 02. ගරු සභාපතිතුමන් විසින් කරනු ලබන නිවේදන

- ගරු සභාපතිතුමා විසින් නිවේදන වාරය ආරම්භ කරමින් ප්‍රකාශ කළේ වැඩ කිරීමේ පහසුව සඳහා පසුගිය සභාවේ දී කාරක සභා පත් කර බලතල පවරා ඇති බැවින් එම කමිටු හරහා ඉටු කළ හැකි කාර්යයන් සිදු කර ගන්නා ලෙස සියලු දෙනාගෙන් ගෞරවයෙන් ඉල්ලා සිටින බවයි.

- අසනීප තත්ත්වයක් හේතුවෙන් 2022-03-08 දින මහ සභාවට සහභාගී නොවන බවත්, නිවාඩු අනුමත කර දෙන ලෙසත්, ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණි විමලසේන මැතිතුමා විසින් කරන ලද ඉල්ලීම ගරු සභාපතිතුමන් විසින් ඉදිරිපත් කරන ලදුව නිවාඩු අනුමත කරන ලදී.

## 03. සංදේශ / පැමිණිලි / පෙත්සම් / ආයාචනා ඉදිරිපත් කිරීම

- පළාත් පාලන සහකාර කොමසාරිස් විසින් "රාජ්‍ය වියදම් සමාලෝචනය සබරගමුව පළාත් රාජ්‍ය සේවය තුළ ක්‍රියාත්මක කිරීම" යන මැයෙන් 2022-02-28 දිනැතිව ලිපියක් එවා ඇති අතර, ප්‍රධාන ලේකම් චක්‍රලේඛ 03/2022 හි, 2021-09-07 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයේ හා අමාත්‍ය මණ්ඩල සංදේශයේ පිටපත්වල සඳහන් කරුණු සම්බන්ධව ගරු සභාවට ඉදිරිපත් කරමින් අදාල ලිපි සභාගත කරන ලදී.

- බළන්ගොඩ නව බස් නැවතුම්පළෙහි ගුවන් පාලම යට තිබෙන හිස් බිම් කැබැල්ලෙහි (ඉදි කිරීමට යෝජිත පැන්තාලිය පිටුපස) තොග වෙළඳාමක් සිදු කර ගැනීම සඳහා තමන්ගේ පුද්ගලික වියදමින් කාමරයක් ඉදි කර ගැනීමට අවසර ලබා දෙන ලෙසත්, නගර සභාවේ තක්සේරුවට අනුව මාසික කුලී පදනම මත බදු අයිතිය ලබා දෙන ලෙසත් ඉල්ලා බළන්ගොඩ, මුගුණමලේ, අංක 701 ඒ ලිපිනයේ පදිංචි ඒ.එල්.එන්. මධුෂිකා දිල්රුක්ෂි යන අය විසින් ඉදිරිපත් කරන ලද ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

මෙහි දී අදහස් දක් වූ ගරු උප සභාපතිතුමා පැන්තාලිය අනිවාර්යෙන්ම ඉදි කළ යුතු අතර, මෙම ලිපිය එවූ අය ඔවුන්ගේ පුද්ගලික වියදමින් කාමරය ඉදි කර, නගර සභාවෙන් තක්සේරු කරන මුදලට ඉල්ලා ඇති බව ද ආදායම් උත්පාදන ව්‍යාපෘතියක් වන බැවින් ලබා දිය හැකි බව ද පැවසීය.

ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා අදහස් දක්වමින් නගර සභාව සතු භූමියක් නම් සභාවෙන් ඉදි කර ටෙන්ඩර් කළ යුතු බව ද තවත් අය මේ ආකාරයට ඉඩම් ඉල්ලා පැමිණියහොත් ලබා දීමට නොහැකි අතර, තමන් මේ සඳහා විරුද්ධ වන බව ද පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රීනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය, අද ලෝක කාන්තා දිනය වන අතර, මන්ත්‍රීවරියන් වශයෙන් එය අභිමානයක් බව ද මෙම ලිපිය ඉදිරිපත් කර ඇත්තේ ද කාන්තාවක් වන බැවින් ගරු සභාපතිතුමාගේ අධීක්ෂණය යටතේ නගර සභාවට පාඩුවක් නොවන පරිදි ලබා දීමට සුදුසු නම් ලබා දෙන ලෙස ඉල්ලා සිටින බව පැවසීය.

ගරු සභාපතිතුමා පැවසුවේ මෙම ස්ථානයම පොල් වෙළඳාමක් සඳහා ලබා දෙන ලෙස බළන්ගොඩ, රාස්සගල පාර, අංක 31 දරණ ලිපිනයේ පදිංචි තරංග දිනේෂ් යන අයද ඉල්ලා ඇති බවයි.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා අදහස් දක්වමින් බස්නැවතුම්පළ සඳහා හැකි නම් ඔප්පුව ලබා ගන්නා ලෙස ද පාලම යට වෙළඳාම සඳහා ඉඩ කොටසක් ලබා දීම සුදුසු යැයි පවසන්නේ නම් එම බිමෙහි අයිතිය පෙන්වන ලෙස ගරු උප සභාපතිතුමාගෙන් ඉල්ලා සිටින බව ද මෙහි අයිතිය පවතින්නේ නාගරික සංවර්ධන අධිකාරියට බව ද පාලම යට ඉදිකිරීම් සිදු කිරීම තහනම් වන අතර, යම්කිසි හේතුවකින් පාලම කඩා වැටුණහොත් යට සිටින මිනිසුන් ගැන වගකියන්නේ කවුදැයි විමසන ලදී.

මෙහි දී ගරු සභාපතිතුමා, පළාත් පාලන සහකාර කොමසාරිස්තුමා විසින් යොමු කරන ලද වෙළඳ කුටි ඉවත් කිරීම සම්බන්ධ ලිපිය ගරු සභාවට ඉදිරිපත් කරමින් ආර්.පී. අතුල ප්‍රියංජිත් වීරකෝන් යන අය ස්වයං රැකියාවක නියුතු අඩු ආදායම්ලාභී අයෙකු නොවන බව ද එකී බිම් කොටස කිසියම් වාණිජ කටයුත්තකට යොදවා සභාවට ආදායම් ලබා ගැනීමේ හැකියාවක් පවතින බැවින් මෙම භූමිය විධිමත්ව උපයෝජනය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙස දන්වා ඇති බව ද පවසන ලදී.

මෙම පුද්ගලයා තම පුද්ගලික මුදලින් ගොඩනැගිල්ල ඉදි කර නගර සභාවේ වැඩිම බදු මුදලක් ගෙවන කඩය බවට පත් කර ගැනීමට කැමති බව පවසා ඇති බව ද මීට පෙර ද සභාවට ආදායම ලබා ගෙන කඩ ඉදි කර දී ඇති බව ද සභාව විසින් තීරණයක් ගන්නා ලෙස ද පැවසීය.

ගරු නාගරික මන්ත්‍රීනී තරංගනී සමරසේකර මැතිතුමිය අදහස් දක්වමින් පාලම යට පොදු කටයුත්තකට හැර වෙළඳාම සඳහා ලබා දීමට තමන් විරුද්ධ බව ද එසේ ලබා දීමට අදහසක් තිබේ නම් ටෙන්ඩර් ක්‍රමයකට ලබා දෙන ලෙස ද බළන්ගොඩ, මුගුණමලේ, අංක 701 ඒ ලිපිනයේ පදිංචිව සිටින්නේ ඒ.එල්.එන්. මධුෂිකා දිල්රුක්ෂි යන නොව වෙනත් අයෙකු බැවින් එම ලිපිනය වැරදි බව ද පැවසීය.

ගරු නාගරික මන්ත්‍රිනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය පැවසුවේ එම ලිපිනයේ කුලියට සිටින බැවින් එසේ ඉදිරිපත් කර ඇති බවයි.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා, මෙම ඉඩම නගර සභාවට අයිති නම් වැඩිම මිලකට බිම ටෙන්ඩර් කරන ලෙස පවසන ලදී.

මේ සම්බන්ධව පළාත් පාලන දෙපාර්තමේන්තුවේ ප්‍රජා සංවර්ධන නිළධාරීතුමාගෙන් කරුණු පැහැදිලි කර ගැනීම සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාව බවට පත් කරන ලදී.

අදාල කරුණු පැහැදිලි කර ගැනීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු උප සභාපති එම්. ටී. එම්. රූමි මැතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත් කරන ලදී.

ඒ අනුව පාලම යට බිම් කොටස ටෙන්ඩර් කිරීමත්, ඉදි කිරීමට යෝජිත ගොඩනැගිල්ල සැලසුම් කිරීම නගර සභාවෙන් සිදු කිරීමත්, එම ටෙන්ඩරය ලබා ගත් පුද්ගලයාගෙන් අවශ්‍ය කරන මුදල ලබා ගෙන නිසි ක්‍රමවේදයකට අනුව බදු දීමත් සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය ස්ථිර කරන ලදී.

- බළන්ගොඩ නගර සභා උද්‍යානයේ පෝනියෙකු පැදවීම සඳහා අවසර ලබා දෙන ලෙස බළන්ගොඩ, රාස්සගල, 7 කණුව ලිපිනයේ පදිංචි ටී.ජී. චන්න විමුක්ති ජයවීර යන අය විසින් කරන ලද ඉල්ලීම් ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

ගරු සභාපතිතුමා පැවසුවේ මේ සම්බන්ධව අනුමැතිය ලබා දෙන්නේ නම් මීළඟ න්‍යාය පත්‍රයට ඇතුලත් කර අවශ්‍ය කටයුතු කළ හැකි බවයි.

ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා අදහස් දක්වමින් ආදායම් උත්පාදන ව්‍යාපෘතියක් වශයෙන් මෙය කළ හැකි අතර, පිට්ටනිය හා ළමා උද්‍යානය අතර තිබෙන බිම් කොටස භාවිතයට ගත හැකි බව පැවසීය.

ගරු නාගරික මන්ත්‍රිනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය පැවසුවේ බළන්ගොඩ ක්‍රීඩා පිටිය හා ඇවිදින මංතීරුව අපිරිසිදු නොවන පරිදි කොන්දේසි පනවා ලබා දීම සුදුසු බවයි.

මේ සම්බන්ධව ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා අදහස් දක්වමින් නුවරඑළිය උද්‍යානයේ සත්ව අපද්‍රව්‍ය ඉවත් කිරීමට අය නොමැති බැවින් බළන්ගොඩ එවැනි තත්ත්වයක් ඇති නොවීමට කටයුතු කළ යුතු බව පවසන ලදී.

- ස්වයං රැකියාවක් වශයෙන් මල් පෝච්චි සහ පැල වෙළඳාම සිදු කර ගෙන යාමට ප්‍රධාන මාර්ගය අසල ස්ථානයක් නොමැති බැවින් මොහාන් එල්ලාවල මාවතේ දොරවෙල ඔය සහ ප්‍රධාන මාර්ගය අසල ඇති බිම් තීරුවේ පරණ යකඩ බඩු එකතු කරන ස්ථානය අසල කොටසක් බදු පදනම මත ලබා

දෙන ලෙස ඉල්ලමින් බළන්ගොඩ, කිරිදිගල, වැලිහරනාව පාර,අංක 35/3 ලිපිනයේ පදිංචි ඒ.කේ.ඒ. නිශ්ශංක පත්ම කුමාර යන අය විසින් කරන ලද ඉල්ලීම් ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

ස්වයං රැකියාවක් වශයෙන් මල් පෝච්චි හා මල් පැළ වෙළඳාම කරගෙන යාමට මෙම ස්ථානයම බදු පදනම මත ලබා දෙන ලෙස බළන්ගොඩ, රාස්සගල පාර, සුදර්ශනපුර, අංක 39 ලිපිනයේ පදිංචි එම්.කේ.ඩී. මුළුතියනගේ යන අය විසින් ද ලිපියක් ඉදිරිපත් කර ඇති බව ගරු සභාපතිතුමා පැවසීය.

ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා පැවසුවේ පෙර ගත් ක්‍රමවේදයම අනුගමනය කළ හැකි නමුත් මෙම ස්ථානයේ නඩුවක් පවතින බැවින් ඒ සම්බන්ධව අවධානය යොමු කරන ලෙසයි.

- නව මහජන පොළ භූමියේ ඉදි කර ඇති එළවළු කඩ කාමර 20 ට අමතරව දොරවල් යොදා ඉදි කිරීමට කඩ කාමර 16 ක් පමණක් ඇති බැවින් එම කඩ කාමර මඟින් ආදායම් උත්පාදනය කර ගැනීමට හැකි බවත්, මහජන පොළ භූමියේ බිම එළවළු තබා ගනිමින් වෙළඳාම් කරනු ලබන ව්‍යාපාරිකයන් මෙම කඩ කාමර බලාපොරොත්තුවෙන් සිටින අතර, දොරවල් දමා මෙම කඩ කාමර ඔවුනට ලබා දීමට යෝජනා කරන බවත් පවසමින් ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා විසින් කරන ලද ඉල්ලීම් ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

  ගරු සභාපතිතුමා පැවසුවේ මීළඟ සභාවේ න්‍යාය පත්‍රයට මෙම යෝජනාව යොමු කර ඉදිරි කටයුතු සිදු කිරීම සුදුසු බවයි.

- බළන්ගොඩ නගර සභාව විසින් බළන්ගොඩ මාධ්‍ය සංවිධානයේ ප්‍රයෝජනය සඳහා ලබා දී ඇති කාමරයෙහි මාධ්‍ය හමු පැවැත්වීමට විවිධ සංවිධාන ඉල්ලීම් කරන බැවින් එම මාධ්‍ය හමු පැවැත්වීම සඳහා ඉඩකඩ ලබා දිය හැකිදැයි උපදෙස් ලබා දෙන ලෙස පවසමින් බළන්ගොඩ ප්‍රාදේශීය මාධ්‍යවේදීන්ගේ එකමුතුව විසින් ඉදිරිපත් කර ඇති ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

  ගරු සභාපතිතුමන් අදහස් දක්වමින් මාධ්‍යවේදීන් බළන්ගොඩ නගර සභාවේ බොහෝ කටයුතු සඳහා විවෘතව තම රාජකාරිය සිදු කළ අතර, නිදහසේ තම කාර්යයන් පහසුවෙන් කරගෙන යාමට බස්නැවතුම්පළ උඩු මහලෙහි කාමරයක් ලබා දී ඇති බවද මෙම කාරණය අමතර දෙයක් වන බැවින් සභාවට තීරණයක් ගැනීම සඳහා යොමු කළ බව ද පැවසීය.
  මේ සම්බන්ධව මාධ්‍යවේදීන්ගෙන් කරුණු පැහැදිලි කර ගැනීම සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්. විමලසිරි මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාව බවට පත් කරන ලදී.

  අදාල කරුණු පැහැදිලි කර ගැනීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත් කරන ලදී.

අනතුරුව ගරු සභාපතිතුමා පැවසුවේ වග කිව යුතු මාධ්‍යවේදීන් වශයෙන් එම ස්ථානයේ මාධ්‍ය හමු පැවැත්වීමේ වගකීම බළන්ගොඩ ප්‍රාදේශීය මාධ්‍යවේදීන්ගේ එකමුතුව විසින් සාධාරණ ලෙස ගෙන ක්‍රියා කරන ලෙසයි.

- පුස්තකාල සහයක තනතුර සඳහා ඉල්ලුම් කර ඇති අයගේ නාම ලේඛනය සභාවේ දැන ගැනීම උදෙසා ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් මෙම තනතුර සඳහා බඳවා ගැනීමේ ක්‍රියාවලිය ප්‍රධාන අමාත්‍යාංශය මගින් සිදු කළ යුතු බැවින් ඉදිරියේ දී විධිමත්ව න්‍යාය පත්‍රයට ඇතුලත් කර අනුමැතිය ලබා ගෙන අවශ්‍ය කටයුතු කරන බව ද අයදුම්පත්‍ර නාම ලේඛනය සභාවේ දැන ගැනීම උදෙසා අද දින ඉදිරිපත් කළ බව ද පැවසීය.

**ගරු නාගරික මන්ත්‍රීනී එම්.ශාන්තිලේඛා මැතිතුමිය පෙ.ව 11.50 ට පමණ සභාවෙන් පිටවන ලදී.**

**04. ටෙන්ඩර්පත් හා මිළ ගණන් විවෘත කිරීම.**

ගරු සභාපතිතුමන් විසින් අද දින ටෙන්ඩර්පත් හා මිල ගණන් නොමැති බව පැවසීය.

**05. කල් දී ඇති ප්‍රශ්න**

**05:01 ගරු නාගරික මන්ත්‍රිනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය**

05:01:01 සෞඛ්‍ය අංශ මගින් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කරන ලද යෝජනාවල ප්‍රගතිය කවරේද?

ගරු සභාපතිතුමන් පිළිතුරු ලබා දෙමින් සෞඛ්‍ය කමිටුවේ සභාපතිනිය වන්නේ ගරු නාගරික මන්ත්‍රිනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය බව ද ප්ලාස්ටික් පොලිතින් බැහැර වීම අවම නොකළහොත් ඉදිරි අවුරුදු දෙකෙහි දී පාලනය කර ගැනීමට නොහැකි තත්ත්වයකට පත් වෙන බැවින් බැංකියවත්ත ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයේ අඩුපාඩුවක්ව පැවති සේවකයන් 04 දෙනෙකු තාවකාලික කොන්ත්‍රාත් පදනමින් සේවයේ යොදවා ගෙන ඇති බව ද දාහක උදුනක් ලබා ගැනීමට වැඩපිළිවෙලක් සකස් කර ඇති බව ද කොම්පෝස්ට් හලන දැල අලුත්වැඩියා කළ අතර, කාණුව සකස් කර ඇති බව ද තීන්ත ආලේප කර ඇති බව ද පැවසීය.

මෙහි දී ගරු නාගරික මන්ත්‍රී ජී. චන්ද්‍රලතා මැතිතුමිය අදහස් දක්වමින් කසළ කළමනාකරණ මධ්‍යස්ථානයේ වහල සඳහා සෙවිලි ලබා ගැනීම සිදු කරන ලෙස ද කම්කරුවන් 06 දෙනෙකු ස්ථිර කර දෙන ලෙස ඉල්ලා සිටින බැවින් එය ඉටු කර දෙන ලෙසද සත්ව අපද්‍රව්‍ය නිසා බස්නැවතුම්පළ ඇතුලත අපිරිසිදු වන අතර, එහි කඩ හිමියන් තම කඩ සීමා ඇතුලත දැලක් යෙදීමට හැකි බව පැවසූ බවද ඉතිරි කොටස සඳහා නගර සභාවෙන් දැලක් යෙදවීම සුදුසු බව ද පැවසීය.

එමෙන්ම කොම්පෝස්ට් අංගනයේ පොලිතින් වර්ග කිරීමේ දී ඒ ඒ මාසයන් හි අදායම් වියදම් තත්ත්වය සඳහන් කළ ගරු නාගරික මන්ත්‍රී ජී. චන්ද්‍රලතා මැතිතුමිය ආදායම් තත්ත්වය වැඩි කර

ගැනීම සම්බන්ධව අවධානය යොමු කරන ලෙස ද දෛනිකව පොලිතින් කිලෝග්රෑම් 30 ක් පමණ වර්ග කරන අතර, කම්කරුවන් 03 දෙනකු අවශ්‍ය නොවන බැවින් එක් කම්කරුවෙකු ඉවත් කර දෛනිකව කිලෝග්රෑම් 30 කට වැඩි ප්‍රමාණයක් තේරීම සඳහා යොමු කරන ලෙස ද පවසන ලදී.

ගරු සභාපතිතුමා පැවසුවේ තමන් සභාපති වශයෙන් පත් වූ පසු සෞඛ්‍ය හා කර්මාන්ත අංශ පිළිබඳව දැඩි අවධානයක් යොමු කළ අතර, අද වන විට ලක්ෂ දෙක හමාරක ලාභයක් පෙන්වා ඇති බවයි.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා අදහස් දක්වමින් හිටපු ගරු ආණ්ඩුකාරතුමා වන ධම්ම දසනායක මැතිතුමා විසින් සෞඛ්‍ය අතුරු ව්‍යවස්ථාවක් සම්මත කරගත් අතර, එහි සීඩී පටයක් පමණක් ලැබුණු බැවින් පිටපතක් ලබා දෙන ලෙස පැවසීය.

**06. කල් දී ඇති යෝජනා**

**06:01 ගරු සභාපති ඩබ්.ඒ.වසන්ත ගුණරත්න මැතිතුමා**

06:01:01 නගර සභා ආඥා පනතේ (අංක 255 වන අධිකාරිය) 19(4) වන වගන්තිය යටතේ බලතල, රාජකාරී හා වගකීම් බළන්ගොඩ නගර සභාවේ නාගරික ලේකම් වන ඩී.එම්.ජේ.යූ.ධර්මරත්න මහතාට පැවරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:02 පදික කඩ කාමර අංක 183/03 ලබා ගෙන ඇති ආර්.ඒ. උදයානන්ද මහතා මියගොස් ඇති බැවින් ඔහුගේ බිරිඳ වන බී.කේ.මනේෂා උදය කාන්ති සමරසිංහ මහත්මිය විසින් ඔවුන්ගේ දරුවා වන ආර්.ඒ.සහන් රශ්මික උදයංග යන අයගේ නමට එම කඩය පවරා දීමට සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:03 බළන්ගොඩ ඉම්පීරියල් ඉදිරිපිට කඩ කාමර 15 හි පදික බදු ගාස්තුවක් පමණක් අය කරන අතර, සම්පූර්ණ අයිතිය නගර සභාව සතු නොවන බැවින් ඒ සම්බන්ධව තීරණයක් ගැනීම හා ඒ සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

මේ සම්බන්ධව පැවති සාකච්ඡාවෙන් අනතුරුව ගරු සභාපතිතුමන් විසින් වසර ගණනාවක සිට අදාල කුලී මුදල් ගෙවීම පැහැර හරිමින් සිටින කඩ හිමියන් සඳහා අදාල මුදල් ගෙවන ලෙස නැවත ලිපියකින් දැනුම් දීම සුදුසු බව පැවසීය.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:04 "බක්මහ මේලා වෙළඳ ප්‍රදර්ශනය හා සැණකෙළිය 2022" සඳහා ප්‍රචාරණ කටයුතු වෙනුවෙන් බළන්ගොඩ නගරය හා ඒ අවට ප්‍රදේශයන්හි බැනර් හා කටවුට් ප්‍රදර්ශනය කිරීමට අවසර ලබා දීම, ගාස්තු අය කිරීම සම්බන්ධව තීරණයක් ගැනීම හා ඒ සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මේ සම්බන්ධව පැවති සාකච්ඡාවෙන් අනතුරුව ගරු සභාපතිතුමන් විසින් ගාස්තු අය කිරීමකින් තොරව බැනර් හා කටවුට් ප්‍රදර්ශනය කිරීමට අවසර ලබා දීම සුදුසු බවට යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රිනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:05 බළන්ගොඩ නගර සභාවේ තක්සේරු ප්‍රතිශෝධනය කිරීම, බදු අය කිරීමේ ප්‍රතිශතය තීරණය කිරීම හා ඒ සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහි දී ගරු සභාපතිතුමන් 2023 වර්ෂයේ තක්සේරු ප්‍රතිශෝධනය ක්‍රියාත්මක කළ යුතු බැවින් දැනට අය කරනු ලබන වරිපනම් බදු ප්‍රතිශතය ගෘහස්ථ 4% ක් ද ව්‍යාපාරික හා ඉඩම් 5% ක් ද වශයෙන් වෙනසකින් තොරව පවතින ප්‍රතිශත අනුවම නව තක්සේරු ප්‍රතිශෝධනය ක්‍රියාත්මක කිරීම සුදුසු බවට යෝජනා කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්.රුමී මැතිතුමා ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:06 බළන්ගොඩ නගර සභාව සතු මැණික් කඩ කාමරවල දීර්ඝකාලීන බදු ගිවිසුම් කාලය අවසන් වී ඇති නිසා ඒ සම්බන්ධව තීරණයක් ගැනීම හා ඒ සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව මඟින් තක්සේරු කර ඇති වටිනාකම මත කී මනි මුදල තීරණය කර ටෙන්ඩර් කරන්නේ ද සභාව මඟින් ඇප

තැන්පත් මුදල තීරණය කර ටෙන්ඩර් කරන්නේ ද නැතහොත් දැනට සිටින බදු කරුවන් හටම නව තක්සේරුවක් මත ලබා දෙන්නේද යන්න සම්බන්ධව සභාවේ තීරණයක් ගන්නා ලෙස පවසන ලදී.

මෙහි දී අදහස් දක්වූ ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා පවසා සිටියේ මෙම කඩ කාමර ලබා ගැනීමට පුද්ගලයන් සිටින අතර, නගර සභාවට විශාල ආදායමක් ලබා ගැනීමට හැකි බැවින් ටෙන්ඩර් කිරීම සුදුසු බවයි.

ගරු නාගරික මන්ත්‍රිනී තරංගනී සමරසේකර මැතිතුමිය අදහස් දක්වමින් ටෙන්ඩර් කිරීමේ දී දැනට සිටින අයට අසාධාරණයක් සිදු වන බැවින් නව තක්සේරු මුදලකට දැනට සිටින අයටම ලබා දෙන ලෙස පැවසීය.

ගරු උප සභාපති එම්.ටී.එම්.රුමී මැතිතුමා පැවසූවේ බළන්ගොඩ ව්‍යාපාරිකයන් ආරක්ෂා වන පරිදි තීන්දු ගත යුතු බවයි.

මේ සම්බන්ධව සභාවේ ඇති වූ සාකච්ඡාවෙන් අනතුරුව ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් බළන්ගොඩ නගර සභාව සතු මැණික් කඩ කාමර ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යටත්ව දැනට සිටින බදු කරුවන් හටම නව තක්සේරුව මත ලබා දීම සුදුසු බවට යෝජනා කළ අතර, එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**ගරු නාගරික මන්ත්‍රිනී එම්.ශාන්තිලේඛා මැතිතුමිය ප.ව 12.25 ට පමණ සභාවට නැවත පැමිණෙන ලදී.**

06:01:07 මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ගේ වැඩ වර්ජනය හේතුවෙන් පොදු වෙළඳසැල අංක 16 දරණ ගව මස් කඩ කාමරය සහ අංක 15 දරණ එළු මස් කඩ කාමරය 2022-02-07 වන දින සිට 2022-02-15 දක්වා ද, 2022-03-02 හා 2022-03-03 යන දිනයන් ද වසා තිබූ බැවින් එම දින 11 සඳහා කඩ කුලී අඩු කිරීම වෙනුවෙන් සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා විසින් මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ගේ වැඩ වර්ජනය හේතුවෙන් දින 11 ක කාලයක් වසා තිබූ පොදු වෙළඳසැල අංක 16 දරණ ගව මස් කඩ කාමරය සහ අංක 15 දරණ එළු මස් කඩ කාමරය සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යටත්ව කඩ කුලී අඩු කිරීම සුදුසු බවට යෝජනා කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්.රුමී මැතිතුමා ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:08 2021 වර්ෂයේ කොරෝනා වසංගතය හේතුවෙන් රට වසා තිබූ කාලයට අදාලව බළන්ගොඩ බස් නැවතුම්පළෙහි සවි කර ඇති විද්‍යුත් නාම පුවරුව සඳහා ගෙවූ කුලී මුදල් වෙනුවෙන් සහනයක් ලබා ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ. ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහි දී ගිවිසුම් කොන්දේසි අනුව කටයුතු කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමන් පවසන ලදී.

ඒ අනුව ඉහත යෝජනාව ගරු සභාවේ ප්‍රතික්ෂේප විය.

06:01:09 2022-04-08 දින සිට 2022-04-12 දින දක්වා (පෙ.ව 8.30 සිට ප.ව.6.30 දක්වා) උත්සව සමයේ ජනතාව දැනුවත් කිරීම වෙනුවෙන් පවත්වන "අවුරුදු උදාන - 2022" වැඩසටහන සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදාල ගාස්තු අය කර ගැනීමෙන් අනතුරුව මෙම වැඩසටහන 2022-04-08 දින සිට 2022-04-12 දින දක්වා (පෙ.ව 8.30 සිට ප.ව.6.30 දක්වා) පැවැත්වීමට අවස්ථාව ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමන් පවසන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:10 2022 වර්ෂය තුළ නගර සභා බල ප්‍රදේශයේ තෝරා ගත් අඩු ආදායම්ලාභීන් 18 දෙනෙකු වෙත වැසිකිළි ආධාර ලබා දීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

| අනු අංකය | නම | ලිපිනය |
|---|---|---|
| 01 | දුනුකාරගේ බේබිනෝනා | නො.167,කුමාරගම,බලංගොඩ |
| 02 | ඇල්ලපොලගේ සුනිල් ශාන්ත | නො.200,චෙට්නොල් පාර,එපිටපැත්ත,බලංගොඩ |
| 03 | රුවන්කුට්ටියලාගේ ගුණපාල | නො.63/11,රාස්සගල, බලංගොඩ |
| 04 | නිකලන්ද වත්තේ ජයසිරි මුණිදාස | ඇල්ලෙඅරාව ,බලංගොඩ |
| 05 | වඩුදුරගේ ලීලා රංජනී | නො.151/බී, පිරුවන පාර,කුමාරගම, බලංගොඩ |
| 06 | පී.ආරෝක්‍යනාදන් | නො.L/2/2, වැවවත්ත,රාස්සගල පාර,බලංගොඩ |
| 07 | චමිලා සුභාෂණී ගුණතිලක | නො.36,සේනක පෙදෙස,බලගහමුල, බලංගොඩ |
| 08 | ලලිතා කුමාරි | පහළ ඇල්ලෙපොල, බලංගොඩ |
| 09 | මැදගෙදර යාඉන්නලාගේ සන්ද්‍යා පුෂ්පකාන්ති | නො.1/47,උඩඇල්ලෙපොල, බලංගොඩ |
| 10 | උඩපත්තුවේ මුහන්දිරම්ලාගේ ගුණසේන | කලුඇල්ල කැලේ පාර, කිරිදිගල, බලංගොඩ |

| | | |
|---|---|---|
| 11 | එන්.වී.දමයන්ති චන්ද්‍රලතා මැණිකේ | ඇල්ලෙඅරාව, බලංගොඩ |
| 12 | ටී.කල්‍යානි | උඩකන්ද පාර,කරව්කැටිය,බලංගොඩ |
| 13 | මොහිදීන් මෙහොමඩ් සලීම් | නො.381/10,දෙහිගස්තලාව,බලංගොඩ |
| 14 | අබේසිංහ ලියනආරච්චිගේ ප්‍රියන්ත | නො.365/10,රත්නපුර පාර,බලංගොඩ |
| 15 | එම්.එච්.කාතුනේ ජෙන්නත් | නො.B/50, FH මාවත,බලංගොඩ |
| 16 | ඩබ්.එම්.සුසිලා රංජනී | නො.26/5,ශෛලතලාරාම පාර,කිරිදිගල,බලංගොඩ |
| 17 | පාණිතුරෙයි කලිච්චෙල්වම් | නො.8,නගර සභා නිවාස,පෙට්ටිගල පාර,බලංගොඩ |
| 18 | පී.ඒ. ප්‍රසන්න උදයශාන්ත | නො 140 සී, ආනන්ද මෛත්‍රී මාවත,තුඹගොඩ,බලංගොඩ |

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මේ සම්බන්ධව අදහස් දක්වූ ගරු සභාපතිතුමා 2022 වර්ෂයේ අයවැය මගින් අඩු ආදායම්ලාභී පවුල් 18 ක් සඳහා එක් අයෙකුට රු.50,000.00 ක් වන සේ වැසිකිළි ආධාර 18 ක් ලබා දීම වෙනුවෙන් රු. 900,000.00 (රුපියල් ලක්ෂ නවයක්) ක මුදලක් වැය කරන බව පැවසීය.

ගරු උප සභාපති එම්.ටී.එම්. රූමි මැතිතුමා අදහස් දක්වමින් පසුගිය වසරවල දී අදියර 03 ක් යටතේ වැසිකිළි ආධාර ලබා දුන් අතර, මෙම වසරේදීද එසේ ලබා දීම සුදුසු බව පවසන ලදී.

ඒ අනුව වැසිකිළි ආධාර එක් අයෙකුට රු.50,000.00 බැගින් වන සේ රු. 900,000.00 (රුපියල් ලක්ෂ නවයක්) ක මුදලක් අඩු අදායම්ලාභී පවුල් 18 ක් සඳහා අදියර 03ක් යටතේ ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදුව ගරු උප සභාපති එම්. ටී.එම්. රූමි මැතිතුමා ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:11 සිමෙන්ති/කම්බි ඇතුළු ඉදි කිරීම් ද්‍රව්‍ය මිලදී ගැනීම වෙනුවෙන් රුපියල් ලක්ෂයක අත්තිකාරම් මුදලක් ලබා දීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:12 බහුකාර්ය සංවර්ධන බලකාය යටතේ බළන්ගොඩ නගර සභාව වෙත යොමු කර ඇති අය පහත තනතුරු සඳහා බඳවා ගැනීමට සහා අනුමැතිය ලබා ගැනීම

- ආර්.පී.එස්.ආර්.රාජපක්ෂ මයා - පණිවිඩකරු
- ඩබ්.පී.ඩී.සංජීව පතිරණ මයා - විදුලි කාර්මික
- යූ.එම්.තුසිත් චාමර සම්පත් මයා - විදුලි කාර්මික
- යූ.ඒ.එච්.එස්.ටී.කේ. දිසානායක මයා - කාර්යාල කාර්ය සහයක
- ජේ.ආර්. ඥානසීලි ජයසූරිය මිය - කාර්යාල කාර්ය සහයක
- අයි. නිශාරි සසිකලා මිය - කාර්යාල කාර්ය සහයක
- එම්.ඩී.සී.කේ.ධර්මසේන මිය - කාර්යාල කාර්ය සහයක
- යූ.එම්.එස්.ඒ. සඳරුවන් මයා - කාර්යාල කාර්ය සහයක

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා විසින් බහුකාර්ය සංවර්ධන බලකාය යටතේ බළන්ගොඩ නගර සභාව වෙත යොමු කර ඇති සේවකයින් මෙහි සඳහන් කර ඇති තනතුරු සඳහා පළාත් පාලන දෙපාර්තමේන්තුවේ අනුමැතියට යටත්ව බඳවා ගැනීම සුදුසු බවට යෝජනා කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:13 පුස්තකාල සහායිකා තනතුර සඳහා අනියම් පදනම මත හා රාජ්‍ය සේවක අර්ථ සාධක අරමුදලට දායකත්වය ලබා දෙන පරිදි එම්.ඩී.ජේ. පෙරේරා මිය සේවයේ යොදවා ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්. රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් එම්.ඩී.ජේ. පෙරේරා යන අය පෙර පාසල් පාලිකාවක් ලෙස වර්ෂ 15 කට ආසන්න කාලයක් දීමනා පදනම යටතේ බළන්ගොඩ නගර සභාවේ සේවය කළ අතර, සේවය ස්ථිර කර ගැනීමට නොහැකි වූ බව පැවසීය. එබැවින් දීර්ඝ කාලයක් සේවය කළ අයෙකු වශයෙන් ඒ සම්බන්ධව සාධාරණව බලා අනියම් පදනම මත හා රාජ්‍ය සේවක අර්ථ සාධක අරමුදලට දායකත්වය ලබා දෙන පරිදි පුස්තකාල සහායිකා තනතුර හෝ නගර සභා පෙර පාසල් පාලිකාවක් වශයෙන් පළාත් පාලන දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව සේවයේ යොදා ගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්. රූමි මැතිතුමා ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:14 තොරතුරු දැන ගැනීමේ පනත ක්‍රියාත්මක කිරීම සඳහා නම් කල නිළධාරී හා තොරතුරු නිළධාරී පත් කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහි දී තොරතුරු දැන ගැනීමේ පනත ක්‍රියාත්මක කිරීම සඳහා නම් කල නිළධාරී වශයෙන් නගර සභාවේ ලේකම් පත් කර ගැනීමත්, තොරතුරු නිළධාරී වශයෙන් ප්‍රධාන කළමනාකරණ සේවා නිළධාරී පත් කර ගැනීමත් සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ. ප්‍රේමකුමාර මැතිතුමා ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:15 2021 භාණ්ඩ සමීක්ෂණ වෙන්දේසි හා අපහරණ ක්‍රියාවලියෙහි ප්‍රගතිය හා S හා D අක්ෂරවලින් සඳහන් භාණ්ඩ කල් පවත්නා භාණ්ඩ ලේඛනවලින් ඉවත් කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනි ජී. චන්ද්‍රලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

මෙහි දී ගරු සභාපතිතුමා විසින් 2021 භාණ්ඩ සමීක්ෂණ වෙන්දේසි හා අපහරණ ක්‍රියාවලියෙහි ප්‍රගතිය සභාවට ඉදිරිපත් කරමින් 2022-02-07 වන දින පැවති මහ සභාවේ තීරණ අංක 06:01:12 යටතේ අනුමැතිය ලැබී ඇති පරිදි වෙන්දේසි කිරීමට අදාල භාණ්ඩ ලැයිස්තුව තාක්ෂණික නිළධාරී විසින් තක්සේරු කර අවම ලංසුව ගෙන, භාණ්ඩ වෙන්දේසියෙන් 2022-03-04 වන දින බිල් අංක 90945 මඟින් රු. 23,770.00 ක මුදලක් සභාව වෙත භාර දී ඇති බව ද ඇමුණුම 02 හි D අක්ෂරයෙන් සඳහන් කර ඇති භාණ්ඩ, රාජ්‍ය ලාංඡනය මකා දමා විනාශ කිරීමටත්, R අක්ෂරයෙන් ඇති භාණ්ඩ අලුත්වැඩියා කර නැවත භාවිතයට ගැනීමටත් කටයුතු කළ බව ද භාණ්ඩාගාර 66 හි අතිරික්ත ලෙස සඳහන් කර ඇති භාණ්ඩ කල් පවත්නා භාණ්ඩ ලේඛනවලට ඇතුලත් කිරීමට කටයුතු කළ බව ද පැවසීය.
එමෙන්ම S හා D අක්ෂරවලින් සඳහන් භාණ්ඩ කල් පවත්නා භාණ්ඩ ලේඛනවලින් ඉවත් කිරීම සුදුසු බව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:16 03/2020 චක්‍රලේඛ ප්‍රකාරව නව බස්නැවතුම්පළ සී 10 කඩ කාමරයේ බදු අයිතිය සංශෝධනය කිරීම හා මුල් බදු ඔප්පුව අවලංගු කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:17 2021 වර්ෂය සඳහා ජාතික ලේඛනාරක්ෂක පනතේ විධිවිධානයන්ට අනුව රජයේ කාර්යාලවල වාර්ෂිකව ලේඛන අපහරණය කිරීම සිදු කළ යුතු බැවින් අභාවිත ලිපිගොනු හා ලේඛණ අපහරණය කිරීම සඳහා පහත සඳහන් අයගෙන් සමන්විත කමිටුවක් පත් කර ගැනීම හා ඒ සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

- ගරු සභාපති ඩබ්.ඒ. වසන්ත ගුණරත්න මැතිතුමා
- ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා
- ලේකම්, ඩී.එම්.ජේ.යූ. ධර්මරත්න මහතා
- ගණකාධිකාරී, එම්.ඩී. එස්. ප්‍රනාන්දු මහතා
- ප්‍රධාන කළමනාකරණ සේවා නිළධාරී, ජී.ඩී.ඒ. සේමපාල මිය
- වැඩ අධිකාරී, සිසිර සේනාධීර මහතා
- මහජන සෞඛ්‍ය පරීක්ෂක, සී.එල්. ආඳාදොල මහතා

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රිනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:18 බළන්ගොඩ ප්‍රාදේශීය ලේකම්ගේ BLDS/PLD/DV/06/Ga.Samaga/mi 04/2022 හා 2022/02/23 දිනැති ගම සමඟ පිළිසඳරක් 2022 ග්‍රාමීය සංවර්ධන වැඩසටහන යටතේ පළාත් පාලන කොට්ඨාස සංවර්ධනය සඳහා (රු.මිලියන 04 බැගින්) දිස්ත්‍රික් ලේකම් විසින් ප්‍රතිපාදන අනුමත කර ඇති බැවින් සහ එම ව්‍යාපෘති පළමු කාර්තුවේ දී ක්‍රියාත්මක කළ යුතු බැවින් ප්‍රජා පාදක සංවිධාන මඟින් අදාල ව්‍යාපෘති ඉටු කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:19 බළන්ගොඩ ප්‍රාදේශීය ලේකම්ගේ BLDS/PLD/DV/05/Ga.Samaga/mi 100 /2022 හා 2022/02/25 දිනැති ගම සමඟ පිළිසඳරක් 2022 ග්‍රාමීය සංවර්ධන වැඩසටහන යටතේ ග්‍රාම නිළධාරී වසමකට වෙන්වන (රු.මිලියන 03 ක් හා මිලියන 100 ප්‍රතිපාදන) සංවර්ධන ව්‍යාපෘති පළමු කාර්තුවේ දී ක්‍රියාත්මක කළ යුතු බැවින් ප්‍රජා පාදක සංවිධාන මඟින් අදාල ව්‍යාපෘති ඉටු කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:20 ඉන්ද්‍රාණි ධම්මිකා දිසානායක යන අයට ලබා දී ඇති බළන්ගොඩ බස්නැවතුම්පොළ අංක 197/21 දරණ කඩ කාමරය මුහාජිරින් මසාහිර් යන අයට පැවරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහි දී ගරු සභාපතිතුමා පැවසුවේ නීත්‍යානුකූලව ලබා දීමට හැකියාවක් ඇත්නම් ලබා දීමට හැකි බවයි.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:21 බළන්ගොඩ නගර සභාව සඳහා අවශ්‍ය තාර බැරල් 100 ක් හා කෝලාස්ට් බැරල් 08 ක් මිලදී ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:22 2022 අප්‍රේල් 02 වන දින සංගීත ප්‍රසංගයක් පැවැත්වීම වෙනුවෙන් නගර සභා ක්‍රීඩාංගනය ලබා දීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

සිංහල ක්‍රීඩා සමාජය විසින් 2022-04-02 වන දින සංගීත ප්‍රසංගයක් පැවැත්වීම සඳහා නගර සභා ක්‍රීඩාංගනය ඉල්ලා ඇති අතර, විනෝද බද්ද වශයෙන් රු.50,000.00 ක මුදලකුත්, ක්‍රීඩා පිටිය සඳහා කුලිය රු.5,000.00 ක මුදලකුත් වශයෙන් රු. 55,000.00 ක මුදලක් අය කර ගැනීමටත්, යම් කිසි අලාභ හානියක් සිදු වුවහොත් පියවා ගැනීමට රු. 100,000.00 ක ආපසු ගෙවන තැන්පතු මුදලක් රඳවා ගැනීමටත් ගරු නාගරික මන්ත්‍රීවරුන්ගේ නිර්දේශය ලැබුණහොත් පමණක් එම මුදල නිදහස් කිරීමටත්, වාහන ඇතුල් නොකිරීම ඇතුළුව ඇතුලත් කිරීමට ඇති සියලු කොන්දේසි සඳහන් කර ක්‍රීඩා පිටිය ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමන් යෝජනා කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්. රූමි මැතිතුමා ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07. මන්ත්‍රී යෝජනා**

**07:01 ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා**

07:01:01 ඩිජිටල් තාක්ෂණය ඔස්සේ නගර සභා සීමාව තුළ දත්ත පද්ධතියක් සැකසීම හා කාර්යාලයේ සියලු කටයුතු ඩිජිටල් තාක්ෂණය භාවිත කරමින් සිදු කිරීමට ජාලයක් සැකසීම

07:01:02 2022 වර්ෂයේ රජයේ අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීමේ දී නගර සභාව මඟින් සිදු කරනු ලබන ව්‍යාපෘතිවල මුදල් ගෙවීම් කටයුතු මුදල් ප්‍රතිපූර්ණය කරන තුරු සභා අරමුදලින් සිදු කිරීමට යෝජනා කිරීම

ඉහත සඳහන් යෝජනා ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රිනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා අදහස් දක්වමින් නගර සභා සීමාව තුළ සිටින සියලු පුරවැසියන්ගේ හා දේපලවල දත්ත ඇතුලත් දත්ත පද්ධතියක් සකස් විය යුතු අතර, නවීන තාක්ෂණය සමඟ සියලු කටයුතු සිදු වන බැවින් ඒ සඳහා මෘදුකාංගයක් සකස් කර, මාසයක් දෙකක් ඇතුලත මෙය ඉටු කළ හැකි බව ද ආයතනයේ සේවාවන් ලබා ගැනීමට පැමිණෙන ජනතාවගේ ජාතික හැඳුනුම්පත් අංකය භාවිත කරමින් සේවා සැපයීමට ක්‍රමයක් සැලසුම් කර, සෑම සේවාවක්ම යාවත්කාලීන කළ හැකි බව ද පවසන ලදී.

එමෙන්ම 07:01:02 යටතේ තමන් විසින් ඉදිරිපත් කළ යෝජනාව නිළධාරීන්ට ගැටලුවක් විය හැකි නිසා ඉල්ලා අස් කර ගන්නා බව පැවසීය.

මෙහි දී ගරු සභාපතිතුමන් අදහස් දක්වමින් ඩිජිටල් තාක්ෂණය ඔස්සේ සියලු කටයුතු සකස් කිරීමට අවශ්‍ය මෘදුකාංගයන් සම්බන්ධව ආයතන කිහිපයක් සමඟ සාකච්ඡා කර ඇති අතර, රුපියල් ලක්ෂ 25 ක් පමණ වැය වන බැවින් මුදල් තත්ත්වය යහපත් වූ පසු ක්‍රියාත්මක කිරීම සුදුසු බව පවසන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**08. කාරක සභා වාර්තා, කමිටු වාර්තා සළකා බැලීම.**

**08:01 2022-02-25 දිනැති මුදල් කමිටු වාර්තාව**

i. සභාව සතු වාහන සඳහා ටයර් හා කොලර් ලබා ගැනීම සඳහා මිළ ගණන් විවෘත කිරීම

ii. ZA 5039 Foton Jcb යන්ත්‍රයෙහි අලුත්වැඩියා සිදු කිරීම

iii. ගිණුම් අංශය සඳහා පරිගණක දෙකක් මිලදී ගැනීම

iv. ළමා උද්‍යානයේ අලුත්වැඩියා සඳහා අවශ්‍ය වයරින් උපාංග ඇතුළු විශේෂිත ආලෝකන ලයිට් මිල දී ගැනීම

v. නගර සභා පෙර පාසලට අවශ්‍ය උපාංග හා ද්‍රව්‍ය ලබා ගැනීමට අදාල ඉල්ලීම අනුමත කර ගැනීම

vi. කොම්පෝස්ට් අංගනයේ අඩුපාඩු සකස් කර ගැනීම සඳහා වන ඉල්ලීම අනුමත කර ගැනීම

vii. ආපදා ණය රු 500,000.00 ක් හා කාර්යසාධන ණය රු. 800,000.00 ක් ගෙවීම අනුමත කර ගැනීම

viii. ඇවිදින මංතීරු දෙවන අදියරට අදාලව නාගරික සංවර්ධන අධිකාරියේ ඉල්ලීම මත කපා බිම හෙලන ලද ලුණුමිදැල්ල හා කායා දැව කඳන් හා සුන්බුන් රු. 20,000.00 ක මුදලකට විකිණීමට අනුමත කිරීම

ix. ඇස්තමේන්තු අනුමත කිරීම

- ලේඩිස්මිත්වත්ත පාර අමිත වර්ණකුලසූරිය මහතාගේ නිවස ඉදිරිපිට කාණුව අලුත්වැඩියා කිරීම - රු. 384,023.01
- පල්ලෙවෙල තරංග හපුගස්වත්ත මහතාගේ නිවස ඉදිරිපිට කාණුව කොන්ක්‍රීට් තහඩු දමා ආවරණය කිරීම - රු. 261,953.88
- බුලත්ගම බෝධිය අසල මාර්ගයේ ආරක්ෂාවට පැති බැම්ම ඉදි කිරීම - රු. 314,150.00
- පැරණි ජල ටැංකිය පාර සංවර්ධනය කිරීම - රු. 280,884.65
- ලේඩිස්මිත්වත්ත මාර්ගය තාර දැමීම - රු. 402,408.52
- බුලත්ගම කිවුලවෙල මාර්ගය තාර දැමීම - රු. 189,683.56
- වෙට්නෝල් පාරේ ප්‍රියන්ත මහතාගේ නිවස ඉදිරිපිට කාණුව අලුත්වැඩියා කිරීම
  - රු. 342,040.30
- පල්ලෙවෙල වෙල අද්දර මාර්ගය සඳහා කොන්ක්‍රීට් පුවරු ඉදි කිරීම - රු. 51,500.00
- දෙල්ගස්වත්ත කෝපිවත්ත පාර සංවර්ධනය කිරීම - රු. 497,320.05
- බැංකියවත්ත තිස්ස මහතාගේ නිවස අසල මාර්ගය අලුත්වැඩියා කිරීම - රු.360,000.00
- කිරිදිගල මැද පාර සංවර්ධනය කිරීම - රු.100,000.00

**08:02 2022-02-15 දිනැති කර්මාන්ත කමිටු වාර්තාව**

i. 2022 පෙබරවාරි මස කර්මාන්ත අංශය මගින් සිදු කිරීමට අපේක්ෂිත කර්මාන්ත සහ නඩත්තු සඳහා නිර්දේශ ලබා දීම

ii. සංවර්ධන කටයුතු සඳහා ලබා දෙන මන්ත්‍රී යෝජනා වෙනුවෙන් නිර්දේශ ලබා දීම

**08:03 2022-03-02 දිනැති කර්මාන්ත කමිටු වාර්තාව**

i. 2022 පෙබරවාරි මස කර්මාන්ත අංශය මගින් සිදු කළ කර්මාන්තවල ප්‍රගතිය

ii. සංවර්ධන කටයුතු සඳහා ලබා දෙන මන්ත්‍රී යෝජනා වෙනුවෙන් නිර්දේශ ලබා දීම

iii. මහජනතාව විසින් ලබා දෙන යෝජනා ක්‍රියාත්මක කිරීම හා වෙනත් යෝජනා ක්‍රියාත්මක කිරීම

**08:04 2022-02-15 දිනැති පරිසර, සෞඛ්‍ය හා ඝන අපද්‍රව්‍ය කළමනාකරණ කමිටු වාර්තාව**

i. බැංකියවත්ත කසල කළමනාකරණ මධ්‍යස්ථානයේ වැසි ජල කාණු පද්ධතිය පිළිසකර කිරීම සම්බන්ධ සාකච්ඡා කිරීම

ii. දාහක යන්ත්‍රය සැකසීම හා බේල් යන්ත්‍රය මිලදී ගැනීම පිළිබඳව සාකච්ඡා කිරීම

iii. බැංකියවත්ත කසළ කළමනාකරණ මධ්‍යස්ථානයේ වහලය සැකසීම පිළිබඳ ප්‍රගතිය වාර්තා කර ගැනීම

iv. සෞඛ්‍ය කම්කරුවන්ගේ හා සෙසු සෞඛ්‍ය අංශයේ පවතින ගැටළු පිළිබඳව කමිටුව වෙත වාර්තා කර ගැනීම

v. මහජන වැසිකිළියේ මුදල් අය කර ගැනීමේ ගැටලු තත්ත්වයන් සාකච්ඡා කිරීම

vi. බස්නැවතුම්පළ ගැටලු තත්ත්වයන් සාකච්ඡා කිරීම

vii. කසළ එකතු කිරීම සම්බන්ධව ගැටලු සාකච්ඡා කිරීම

viii. ඇඹිලිපිටිය නගර සභාවේ දැනට භාවිත කරන මෘදුකාංගය කසළ එකතු කරන ට්‍රැක්ටරය සඳහා යොදා ගැනීමට සාකච්ඡා කිරීම

ix. කසළ ටෙන්ඩර්කරු සඳහා අමතර ට්‍රැක්ටරයක් ලබා දීමට සාකච්ඡා කිරීම

මෙදින සභාවට ඉදිරිපත් කරන ලද කාරක සභා වාර්තාවල සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කිරීමට ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**09. ආදායම් වියදම් වාර්තා සළකා බැලීම.**

**2022-02-01 සිට 2022-02-28 දක්වා ආදායම් හා වියදම්**

| | |
|---|---|
| පුනරාවර්තන ලැබීම් | 9,581,648.46 |
| වෙනත් ලැබීම් | 1,923,823.92 |
| මුලු ලැබීම් | 11,505,472.38 |
| පුනරාවර්තන වියදම් | 9,850,356.14 |
| වෙනත් වියදම් | 2,576,405.34 |
| මුලු වියදම් | 12,426,761.48 |

**2022-02-01 සිට 2022-02-28 දක්වා ඉන්ධන වාර්තාව**

| වාහන අංකය | මුළු එකතුව |
|---|---|
| 56-1906 | 16,821.42 |
| 227-5020 | 42,333.00 |
| RD - 8240 | 24,442.00 |
| 226-7521 | 6,050.00 |
| BC-0005 | 24,200.00 |
| GC 0001 | 3,146.00 |
| LL - 7688 | 8,349.00 |
| DDR 0008 | 1,089.00 |

| | |
|---|---|
| JD-4684 | 1,936.00 |
| LL-2110 | 5,528.83 |
| ND-5124 | 32,527.22 |
| PF-4006 | 36,519.60 |
| QL-2901 | 5,664.00 |
| RC-1107 | 0.00 |
| RE 2600 | 5,566.00 |
| 37-7933 | 5,120.00 |
| RC 8183 | 19,476.00 |
| HF 8558 | 2,420.00 |
| VI 1833 | 2,301.00 |
| RB 4786 | 18,029.00 |

| | |
|---|---|
| RC 1118 | 18,951.00 |
| ZA 5039 | 115,666.00 |
| GK 1483 | 19,239.00 |
| RD 8000 | 12,705.00 |
| DPP 0006 | 1,490.00 |
| OV/M 0017 | 885.00 |
| CSM 0009 | 484.00 |
| MG 0014 | 12,100.00 |
| UQ 1933 | 3,540.00 |
| **එකතුව** | 446,578.07 |

මෙදින සභාවට ඉදිරිපත් කරන ලද ආදායම් වියදම් වාර්තා හා ඉන්ධන වාර්තා සඳහා විරෝධතා ඉදිරිපත් නොවූ හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**10. ඇස්තමේන්තු අනුමත කිරීම**

**10.01 ගරු සභාපති ඩබ්.ඒ.වසන්ත ගුණරත්න මැතිතුමා**

10:01:01 නගර සභා පරිශ්‍රය සඳහා අත්‍යවශ්‍ය වන 20 KV ඩීසල් ජෙනරේටරයක් මිල දී ගැනීම සඳහා සබරගමුව පළාත් සභාවේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් ඉංජිනේරු සේවා කාර්යාලයේ විදුලි ඉංජිනේරු වන ඩබ්.එම්.කේ.ඊ. වීරසිංහ මහතා විසින් සකස් කරන ලද හා සබරගමුව පළාත් සභා නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) අජිත් පනාගොඩ මහතාගේ අත්සනින් යුතුව ලබා දී තිබූ රුපියල් තිස්තුන් ලක්ෂ අසූ දෙදහස් පන්සියයක (රු.3,382,500.00) ඇස්තමේන්තුව හා පිරිවිතර සඳහා සභා අනුමැතිය ලබා ගැනීම (2022-02-28 වන දිනට මහ බැංකුව විසින් ඇමරිකානු ඩොලරයක් සඳහා ප්‍රකාශිත මිල රු.200.92 කි.)
ඉහත සඳහන් ඇස්තමේන්තු යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මේ සම්බන්ධව පැවති සාකච්ඡාවෙන් අනතුරුව 20 KV ඩීසල් ජෙනරේටරයක් මිල දී ගැනීම සඳහා රුපියල් තිස්තුන් ලක්ෂ අසූ දෙදහස් පන්සියයක (රු.3,382,500.00) ඇස්තමේන්තුව හා පිරිවිතර අනුමත කිරීම සුදුසු බවත්, මේ සඳහා ශ්‍රී ලංකාව තුළ සීමිත සැපයුම්කරුවන් සඳහා පමණක් මිල ගණන් කැඳවීම සුදුසු බවටත් පහත සඳහන් පරිදි ලංසු විවෘත කිරීමේ කමිටුව, ප්‍රසම්පාදන කමිටුව හා තාක්ෂණික ඇගයීම් කමිටුව සඳහා සාමාජිකයින් පත් කර ගැනීම සුදුසු බවටත් ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමා ස්ථිර කරන ලදී.

**ලංසු විවෘත කිරීමේ කමිටුව**,

- ගරු සභාපති ඩබ්.ඒ වසන්ත ගුණරත්න මැතිතුමා
- ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමා

- ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා
- ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා
- ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමා
- ප්‍රධාන කළමනාකරණ සේවා නිළධාරී ජී.ඩී.ඒ.සෝමපාල මිය
- කාර්මික නිළධාරී ඩබ්.එම්.සී.එම්.බී.මානිපුර මහතා

**ප්‍රසම්පාදන කමිටුව ලෙස ගරු සභාව ක්‍රියාත්මක වීම**

**තාක්ෂණික ඇගයීම් කමිටුව**

- විදුලි ඉංජිනේරු, සබරගමුව පළාත් සභාවේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් ඩබ්.එම්.කේ.ඊ. වීරසිංහ මහතා
- ලේකම්, ඩී.එම්.ජේ.යූ. ධර්මරත්න මහතා
- ගණකාධිකාරී, එම්.ඩී.එස්. ප්‍රනාන්දු මහතා
- වැඩ අධිකාරී, පී.ඩබ්. සිසිර සේනාධීර මහතා

එමෙන්ම ගරු සභාපතිතුමන් විසින් රේන්බෝ පේජස් හා අන්තර්ජාල පිරික්සුම මඟින් ලබා ගත් පහත සඳහන් ආයතනවලින් 20 KV ඩීසල් ජෙනරේටරයක් මිලදී ගැනීම වෙනුවෙන් සීමිත මිල ගණන් කැඳවීම සුදුසු බවට යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රිනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

- ඩිමෝ ප්‍රයිවට් ලිමිටඩ්, කිංස්ලි පාර, කොළඹ 08
- හේලීස් ඇරන්ට්‍රා ප්‍රයිවට් ලිමිටඩ්, නො. 25, පාස්ටර් පාර, කොළඹ 10
- යුනයිටඩ් ට්‍රැක්ටර්, අංක 683, කොළඹ පාර, වත්තල
- ට්‍රේඩ් ප්‍රමෝටස් ලිමිටඩ්, 272/25, සුදර්ශන මාවත, මාලඹේ
- අබාන්ස් පීඑල් සී, 498, ගාලු පාර, කොළඹ 03
- ජෝර්ජ් ස්ටුවඩ් සොලියුෂන් ප්‍රයිවට් ලිමිටඩ්, නො.439, ගාලු පාර, කොළඹ 03
- බ්‍රවුන්ස් ඇන්ඩ් කම්පැණි පී එල් සී, නො. 34, සර් මොහොමඩ් මැකෝන් මාවත, කොළඹ 08
- මෙට්‍රොපොලිටන් ටෙක්නොලජීස් ප්‍රයිවට් ලිමිටඩ්, නො 12, බන්ධනාගාර මාවත, කොළඹ 08
- යූ.එම්.එල් හෙවි ඉක්විත්මන්ට් ලිමිටඩ්, නො.468, නුවර පාර, පෑලියගොඩ
- ශ්‍රී ලංකා වාණිජ නීතිගත සංස්ථාව, නො 100, නවම් මාවත, කොළඹ 02
- මාල්බෝ ට්‍රේඩින් කොම්පැණි , නො.24, අබ්දුල් ගෆූර් මාවත, කොළඹ 03
- ඇරෝමැක්ස් ට්‍රේඩස්, නො 82/1, බණ්ඩාරණායක මාවත, කොළඹ 12
- ටෝකියෝ ට්‍රේඩින්, නො 203, මැසෙන්ජර් වීදිය, කොළඹ 12
- එක්සෙල් එනර්ජි ලංකා ප්‍රයිවට් ලිමිටඩ්, නො 252, ශ්‍රී සුමංගල මාවත, නිවුන්බරව, ජා ඇල

- ඇසෝසියේටඩ් මෝටර්වේස් ප්‍රයිවට් ලිමිටඩ්, නො 185, යූනියන් පෙදෙස, කොළඹ 02
- ජිනසේන ප්‍රයිවට් ලිමිටඩ්, නො 186, ඇල්විටිගල මාවත, කොළඹ 08

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

10:01:02 තානායම්වත්ත පාර වැසි ජල කාණු පද්ධතිය ඉදි කිරීම සඳහා වන ඇස්තමේන්තු මුදල - රු. 535,951.27

ඉහත සඳහන් ඇස්තමේන්තු යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත ඇස්තමේන්තු යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

10:01:03 පරණ වතුර ටැංකිය අසල මාර්ගය රණපුරදේව මියගේ නිවස දක්වා සංවර්ධනය කිරීම සඳහා වන ඇස්තමේන්තු මුදල - රු. 1,000,000.00

ඉහත සඳහන් ඇස්තමේන්තු යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත ඇස්තමේන්තු යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

10:01:04 බැංකියවත්ත කොම්පෝස්ට් අංගනයේ සිට ඉදිරියට මාර්ගය තාර දැමීම සඳහා වන ඇස්තමේන්තු මුදල - රු. 505,000.00

ඉහත සඳහන් ඇස්තමේන්තු යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රිනී ජී. චන්ද්‍රලතා මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත ඇස්තමේන්තු යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

10:01:05 බුලත්ගම රිෂානා මාර්ගය තාර දැමීම සඳහා වන ඇස්තමේන්තු මුදල - රු. 510,234.08

ඉහත සඳහන් ඇස්තමේන්තු යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්. රුමී මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත ඇස්තමේන්තු යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

10:01:06 හුණුකුඹුර සෙල්වකුමාර මහතාගේ නිවස පිටුපස ඇති පැතිබැම්ම සංවර්ධනය කිරීම සඳහා වන ඇස්තමේන්තු මුදල - රු. 715,422.01

ඉහත සඳහන් ඇස්තමේන්තු යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත ඇස්තමේන්තු යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

10:01:07 කිවුලවෙල මාර්ගයේ පැති බැම්ම, කාණු සහ මාර්ගය පිළිසකර කිරීම සඳහා වන ඇස්තමේන්තු මුදල - රු. 500,000.00

ඉහත සඳහන් ඇස්තමේන්තු යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්. රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත ඇස්තමේන්තු යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

10:01:08 මුගුණමලේ බණ්ඩාරවත්ත මාර්ගය සංවර්ධනය කිරීම සඳහා වන ඇස්තමේන්තු මුදල - රු. 500,000.00

ඉහත සඳහන් ඇස්තමේන්තු යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත ඇස්තමේන්තු යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

10:01:09 මුගුණමලේ ගලපල්ලෙඅරාව මාර්ගය සංවර්ධනය කිරීම සඳහා වන ඇස්තමේන්තු මුදල රු. 500,000.00

ඉහත සඳහන් ඇස්තමේන්තු යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්. රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත ඇස්තමේන්තු යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

10:01:10 බළන්ගොඩ ගඟ පාර කැඩී ගිය ස්ථානයේ පැති බැම්ම ඉදි කිරීම සඳහා වන ඇස්තමේන්තු මුදල රු. 500,000.00

ඉහත සඳහන් ඇස්තමේන්තු යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රිනී ජී.චන්ද්‍රලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත ඇස්තමේන්තු යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

10:01:11 සඳුන්ගම බුදු මැඳුර ළඟ වම්පස මාර්ගය පැති බැම් බැඳ මාර්ගය සංවර්ධනය කිරීම සඳහා වන ඇස්තමේන්තු මුදල - රු. ලක්ෂ 15

ඉහත සඳහන් ඇස්තමේන්තු යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්. රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත ඇස්තමේන්තු යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

10:01:12 කරවිකැටිය උඩකන්ද මාර්ගය ප්‍රිමික්ස් යොදා සංවර්ධනය කිරීම - රු .800,000.00

ඉහත සඳහන් ඇස්තමේන්තු යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්. විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත ඇස්තමේන්තු යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**11. පෞද්ගලික මන්ත්‍රී පැහැදිලි කිරීම්**

**ගරු නාගරික මන්ත්‍රිනී මංගලිකා ඉලංකොන් මැතිතුමිය**

ගරු නාගරික මන්ත්‍රිනී මංගලිකා ඉලංකෝන් මැතිතුමිය අදහස් දක්වමින් රජය මගින් ජනතාවට බෙදා දීම සඳහා පැල වර්ග ලබා දුන් නමුත් බෙදා හැරීමට වාහනයක් නොමැති නිසා තම දීමනාවෙන් වාහන කුලී ලබා දුන් බව ද ගරු සභාපතිතුමා සභාපතිවරයා වශයෙන් පත් වූ පසු මේ සඳහා වාහනයක් ලබා දෙන ලෙස ඉල්ලීමක් කළ අතර, එම ඉල්ලීම කළ විගසම එතුමා එය ඉටු කළ බව ද ඒ සම්බන්ධව ස්තුතිවන්ත වන බව ද පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී කේ.ජී. පේමදාස මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී කේ.ජී. පේමදාස මැතිතුමා අදහස් දක්වමින් කුමාරගම කොට්ඨාසය තුලට කසළ ට්‍රැක්ටර් ගමන් නොකරන නිසා සතියකට දෙවරක් හෝ කුමාරගම පිරුවන හා ආර්ථික සංවර්ධන මධ්‍යස්ථානය අසලින් ගමන් කරන ලෙස ට්‍රැක්ටර් රථයක් ලබා දෙන ලෙස පවසන ලදී.

ගරු සභාපතිතුමා මෙහි දී පවසා සිටියේ මාර්ගයේ පවතින අධික බෑවුම නිසා ඇතිවන ගැටලුකාරී තත්ත්වයන් මත ට්‍රැක්ටර් ගමන් කිරීමේ අපහසුවක් පවතින බවත් කාපට් ව්‍යාපෘතියක් ක්‍රියාත්මක වන බවත්ය.

**ගරු නාගරික මන්ත්‍රිනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය**

ගරු නාගරික මන්ත්‍රිනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය අදහස් දක්වමින් කිරිමැටිතැන්න අලාබ්දීන් මාවතේ පිහිටි නගර සභාව සතු ඉඩමෙන් පොළ භූමියේ සිටින පවුල් 05 සඳහා තාවකාලික නිවාස ඉදි කළ හැකි නම් එය ඉටු කර දෙන ලෙස ද තුඹගොඩ ආනන්ද මෛත්‍රී මාවතට හැරෙන ස්ථානයේ පාසල් නිම වන අවස්ථාවේ දී තදබදයක් ඇති වන බැවින් මාර්ගයේ එක් පැත්තකින් කහ ඉරි ඇඳ වාහන නැවැත්වීමට සකස් කර දෙන ලෙස ද විදුලි බල මණ්ඩලයට ඇස්තමේන්තුවක් ලබා දීමට අවශ්‍ය වුවත් තවමත් එය ඉටු වී නැති බව ද පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රිනි තරංගනී සමරසේකර මැතිතුමිය**

ගරු නාගරික මන්ත්‍රිනී තරංගනී සමරසේකර මැතිතුමිය අදහස් දක්වමින් තමන් ජනවාරි මාසයේ මහ සභාවට කල් දී ඇති ප්‍රශ්න කිහිපයක් යොමු කළ අවස්ථාවේ එම ප්‍රශ්න පෙබරවාරි මස සභාවට ඇතුලත් කරන බව පැවසුව නමුත් එය ඉටු නොවූ නිසා මීළඟ සභාවට යොමු කරන ලෙස ද මැණික් කඩ සම්බන්ධව ගත් තීරණයේ දී නගරයේ හැමදාම සිටින අයටම දෙමු යැයි පැවසූවේ නව පිරිසකට ලබා දීමෙන් අවුරුදු 20ක් 30 ක් එම ස්ථානයේ සිටි අයට අසාධාරණයක් වන නිසා බව ද පොදුවේ ටෙන්ඩර් කරන්නේ නම් නගර සභාවේ ගිවිසුම් කාලය අවසන් වූ බොහෝ කඩ තිබෙන බව ද විවිධ හේතු මත එක කොටසක් පමණක් තෝරා නොගෙන පොදු තීරණයක් ගන්නා ලෙස ද පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා අදහස් දක්වමින් නගර සභාව සම්බන්ධව ලිපි පළ නොවීම ගැන කණගාටු වන බවද පියසේන මහතාට පත්තරයක ලිපියක් පළ කිරීමට ආරාධනා කරන බව ද බළන්ගොඩ හොඳම කර්තෘ සම්මානය එතුමාට ලැබුණු නිසා මාධ්‍ය කටයුතු වෙනුවෙන් කාමරයක් ලබා දුන් බව ද තමන් වැඩිම කාලයක් සභාපති වශයෙන් සිටි බැවින් යම් යම් දේ වෙනුවෙන් CID වෙත සාක්ෂි දීමට ගිය නමුත් එසේ ගියේ වැරදි සිදු කළ නිසා නොවන බව ද තානායමේ කාලය දීර්ඝ කර ගැනීමේ දී ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමා එය ඉටු කර දුන් බව ද එතුමාට මෙන්ම එතුමාගේ පියාට ද තමන් ගෞරව කරන බව ද නගර සභාවට තානායම ලබා ගැනීම සඳහා තමන් දරපු උත්සාහය කිසිවෙකු නොදන්නා අතර, හැකි නම් අයිතිය ගෙන එන ලෙස ද ලබන වසරේ දී ලංකාව හැර යාමට සිටින බැවින් මෙම දේවල් අවශ්‍ය නොවන බව ද පවසන ලදී.

එමෙන්ම අවුරුදු 10 ක් මෙම තත්ත්වයට පැමිණීමට හැකි වූයේ ගරු හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා නිසා බැවින් තමන් එතුමාට ගරු කරන බව ද තමන් 1991 වසරේ සිට මේ දක්වා පැමිණ ඇත්තේ ඡන්දදායකයන් සෑදූ නිසා බව ද සභාපතිතුමාට විරුද්ධ වූ ප්‍රකාශ ඇතුලත් වාර්තා තමන් සතුව පවතින බව ද ගරු නාගරික මන්ත්‍රිනී එම්.ශාන්තිලේඛා මැතිතුමියගේ මවට ඉක්මන් සුවය ප්‍රාර්ථනා කරන බව ද ගරු සභාපතිතුමාට ඉදිරි කටයුතු කරගෙන යාමට ශක්තිය ධෛර්යය ලැබේවායි ප්‍රාර්ථනා කරන බවද පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී එම්. ජුනයිදින් මලීක්ෂා මැතිතුමා අදහස් දක්වමින් මාධ්‍යවේදීන් සම්බන්ධව අද දින සභාවේ කතාබහක් ඇති වූ අතර, මාධ්‍ය නිදහස තිබිය යුතු බවද බස්නැවතුම්පළෙහි මාධ්‍ය කටයුතු සඳහා ලබා දී ඇති කාමරය තුළ ඔවුන්ට නිදහසේ වැඩ කිරීමට අවස්ථාව දිය යුතු බව ද පැවසීය.

එමෙන්ම සිංහල හින්දු අලුත් අවුරුදු කාලය තුල වාහන තදබදය හේතුවෙන් වෙළඳසැල් සඳහා ඇතුල්වීමට පවා අපහසු අතර, මේ සම්බන්ධව පොලීසිය හා වෙළඳ සංගමය සමඟ සාකච්ඡා කර වාහන නැවැත්වීමේ කටයුතු නිසි පරිදි සිදු කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස ද අද වන විට රටේ පවතින තත්ත්වය අනුව

පෙළපාලි යාම හා උද්ඝෝෂණය කිරීම සිදු නොකළ යුතු අතර, පක්ෂ භේදයකින් තොරව මෙම අයහපත් තත්ත්වයෙන් මේ රට බේරා ගැනීමට සියලු දෙනා එකතු විය යුතු බව ද පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී කේ.ජී. පේමදාස මැතිතුමා ප.ව 12.50 ට පමණ සභාවෙන් පිටවන ලදී.**

**ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය**

ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය අදහස් දක්වමින් අද දින කාන්තාවන් වෙනුවෙන් වෙන් කළ දවසක් බව ද කාන්තාවන් එක් දිනක් නොව 365 දවසේම වැඩ කරන බව ද රටේ පවතින තත්ත්වය මත කාන්තාවන් ඉතාමත්ම අසරණභාවයට පත්ව ඇති බව ද රටේ අමුතුම දේශපාලනයක් පවතින බව ද ඉදිරියේ දී සියලුම දෙනා එකතු වී රටේ පවතින තත්ත්වය නිමා කිරීම සඳහා කටයුතු කළ යුතු බව ද සිතට ධෛර්යය ගෙන ජීවිතය ගෙවීමට සියලුම කාන්තාවන්ට ශක්තිය ලැබේවායි ප්‍රාර්ථනා කරන බව ද පැවසීය.

එමෙන්ම තමන් අවුරුදු 04 ක් පමණ සභාවට පැමිණ තුඹගොඩ පන්සලේ ප්‍රශ්නය පිළිබඳව නිරන්තරයෙන් පැවසුව අතර, ගරු ස්වාමීන් වහන්සේ හා ව්‍යාපාරික ප්‍රජාව තමන් සමඟ සාකච්ඡා කර, උදව් කිරීමට කැමැති වූ නමුත් එය ඉටු කිරීමට අවස්ථාව නොලැබුණු බව ද සම්බන්ධීකරණ කමිටුවලදී පවා කතා කළ බව ද මේ වන විට එම කටයුත්ත ආරම්භ කර තිබීම සම්බන්ධව ස්තුතිවන්ත වන බව ද පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා ප.ව 12.58 ට පමණ සභාවෙන් පිටවන ලදී.**

**ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා අදහස් දක්වමින් කර්මාන්ත කමිටුවට හා මාසික මහ සභාවට කිහිපවරක්ම තමන් විසින් ඉදිරිපත් කරන ලද පල්ලෙවෙල සුසිලා මහත්මියගේ නිවස ඉදිරිපිට බෝක්කුව හා ලේඩිස්මිත්වත්ත පාර තාර දැමීම යන යෝජනා දෙක සිදු කරන්නේ කවදාදැයි පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා**

ගරු උප සභාපති එම්.ටී.එම්. රූමි මැතිතුමා අදහස් දක්වමින් කහටපිටිය මාර්ගයේ පාසල් ළමයින්ට ගමන් කිරීමේ දී දුෂ්කරතා ඇති වන බැවින් එය ඉක්මනින් ඉටු කර දෙන ලෙස පැවසීය.

**ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා අදහස් දක්වමින් තුඹගොඩ මගී නැවතුම්පළ ඉදි කිරීම පිළිබඳව අවධානය යොමු වීම සම්බන්ධව ස්තුතිවන්ත වන බව ද සියලුම දේ මිළ අධික වීම නිසා

මහජනතාව අසීරුතාවයට පත්ව ඇති බව ද මෙම අසීරුතාවයන් සම්බන්ධව නොබියව කතා කරන සභාපතිවරයෙක් වශයෙන් විවිධ ආයතන සමග පවතින සාකච්ඡා වලදී පවසන ලෙස ද එක රටක් එක නීතියක් බව පැවසූ නමුදු එය වල් වැදී ඇති බව ද අවශ්‍ය තැන්වල දී අවශ්‍ය කරුණු කාරණා ඉදිරිපත් කිරීමට ගරු සභාපතිතුමාට ශක්තිය ධෛර්යය ලැබේවායි ප්‍රාර්ථනා කරන බව ද පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී රවින්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා ප.ව 1.00 ට පමණ සභාවෙන් පිටවන ලදී.**

**12. අවසානය**

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් ගරු නාගරික මන්ත්‍රිනී තරංගනී සමරසේකර මැතිතුමිය හා ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් ලිපියක් ලබා දුන් නමුත් සභාව අවසානයේ ලබා දීමෙන් කිසිවක් කර ගත නොහැකි බව ද කර්මාන්ත කමිටු ගරු සභාපතිතුමා විසින් නිරන්තරව විමසීම් කරන අතර, ඒ සම්බන්ධව සතුටු බව ද ඉන්ධන ගැටලුව නිසා සංවර්ධන ගමන යම් අඩාලවීමක් ඇති වූ නමුත් නිළධාරීන් හා ගරු මන්ත්‍රීවරුන්ගේ උත්සාහය නිසා ඉන්ධන ගැටලුව කෙසේ හෝ නිරාකරණය කර ගත් බව ද කර්මාන්ත කමිටුවෙන් විශාල වැඩ කොටසක් සිදු කරමින් යන බව ද ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා පැවසූ යෝජනාව ක්‍රියාත්මක කරමින් සිටින අතරවාරයේ ඉන්ධන ගැටලුව ඇති වූ අතර, ඉදිරියේ දී එම සංවර්ධන කටයුත්ත සිදු කරන බව ද එතුමා තමන්ගේ කොට්ඨාසයේ කෙනෙක් වුව ද තුඹගොඩ පන්සලේ කාණුව සංවර්ධනය කිරීමේ කාර්යය අධීක්ෂණය කිරීම සඳහා පත් කර ඇති බව ද මන්ත්‍රීවරයෙක්ට ලබා දී ඇති දෙයක් ඔහු අභිබවමින් තමන් සිදු නොකරන බව ද තමන් නීතියට ගරු කරන බව ද හානියක් නොවන පරිදි අවශ්‍ය තැන දී නීතිය නවත්න සිදු වුවහොත් නවන බව ද පැවසීය.

එමෙන්ම නීත්‍යානුකූලව ටෙන්ඩර් කරන්න වුවහොත් ටෙන්ඩර් නොකර සිටිය නොහැකි බව ද එවැනි අවස්ථාවක දී සභාවේ දී තීරණයක් ගෙන ගරු ආණ්ඩුකාරතුමාගේ හෝ අමාත්‍යවරයාගේ අනුමැතිය අනුව කටයුතු සිදු කළ යුතු බවද අංක 9 හා 10 දරණ මාළු කඩ නඩුව සමථයකට පත් කර ගැනීම සම්බන්ධව අද දින තමන් සමඟ කතා කළ නමුත් හිඟ කුළී අය කිරීමේ නීතිමය ගැටලුවක් පවතින බව ද අවුරුදු 25 -30 ක කාලයක් පැවතුණු ගැටලුවකට ක්ෂණික විසඳුම් ලබා දිය නොහැකි බව ද බුදු පිළිමය ඉදිරිපිට කුකුල් මස් කඩය සම්බන්ධව තමන් සමඟ කතා කළ දේ පටිගත කර හාමුදුරුවන් වෙත යොමු කළ අයෙක් සිටින බව ද තමන් නීතියට අනුව කටයුතු කරන අතර, මහජන සෞඛ්‍ය පරීක්ෂක අනුමත කිරීමට නිර්දේශ කරන්නේ නම් තමන්ට ගැටලුවක් නොමැති බව ද සියලුම දෙනා ආරක්ෂා කර ගනිමින් වැඩ කටයුතු සිදු කරන බව පවසන ලදී.

ගරු සභාපතිතුමා තවදුරටත් අදහස් දක්වමින් කොරෝනා වසංගතය හේතුවෙන් ඉන්ධන නිෂ්පාදනය අඩු වූ බව ද ලෝකය යථා තත්ත්වයට පත්වෙමින් පවතින විට ඉන්ධන ඉල්ලුම අධික වී ඇති නමුත් ඉල්ලුමට සරිලන පරිදි නිෂ්පාදනය සිදු නොවීම නිසා මෙම ගැටලු උද්ගත වී ඇති බව ද පොහොර ගැටලුව ආණ්ඩුව විසින් ගත් වැරදි තීරණයක් බව ද රට යථා තත්ත්වයට පත් වේ යැයි සිතන විට රුසියානු යුක්රේන යුද්ධය ඇති වූ බව ද ගරු ආණ්ඩුකාරතුමා මාර්තු 15 පැමිණෙන අතර, එම අවස්ථාවට සහභාගී වන ලෙස ද කුරගල රජ මහා විහාරයේ අති පූජ්‍ය වතුරකුඹුරේ ධර්මරතන හිමියන් පෙර දිනයේ බළන්ගොඩ නගර සභාවට වැඩම කළ අතර, එහි දී ගරු අමාත්‍ය නාමල් රාජපක්ෂ මැතිතුමාට කතා කර බළන්ගොඩ නගර සභාවට යම් උදව්වක් ලබා දෙන ලෙස ඉල්ලීමක් කළ බව ද මොහාන් එල්ලාවල

මාවතේ වීදි ලාම්පු ගැටලුව ඉක්මනින් විසඳිය හැකි බව ද දාහක යන්ත්‍රය ගැනීමට හැකි බව ද සභාවේ උණුසුම් වාද විවාද අඩුවීමක් පෙනෙන බව ද මාධ්‍යවේදීන්ට මාධ්‍ය නිදහස ලබා දී ඇති බව ද පවසමින් අද දින සභාවේ කටයුතු සාර්ථක කර ගැනීමට සහභාගි වූ ගරු මන්ත්‍රී මණ්ඩලය, ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලය හා මාධ්‍යවේදීන් සියලු දෙනාට ස්තුතිය පළ කරමින් මෙදින මහ සභාවේ වැඩ කටයුතු ප.ව.1.20ට පමණ අවසන් කරන ලදී.

ඩබ්.ඒ.වසන්ත ගුණරත්න,
සභාපති,
බළන්ගොඩ නගර සභාව.